# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## හඳගල වලගම්බා පුරාණ ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ)

**හඳගල වලගම්බා පුරාණ ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය විසින්
2011 ජනවාරි මස 20 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2011 ජනවාරි මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[65 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# හඳගල වලගම්බා පුරාණ ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ)

## හඳගල වලගම්බා පුරාණ ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

“හඳගල වලගම්බා පුරාණ ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාව” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සභාවක් එහි සාමාජිකයන් විසින් එකඟ වී ඇති රීති අනුව, එකී සභාවට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සභාව පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී සභාව විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් ද සහ එම සභාව සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2011 අංක  දරන හඳගල වලගම්බා පුරාණ ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

හඳගල වලගම්බා පුරාණ ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම, ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු “සභාව” යනුවෙන් සඳහන් කරනු ලබන) හඳගල වලගම්බා පුරාණ ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාවේ තත්කාලීන සාමාජිකයන් හා මින් මතු මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරනු ලබන තැනැත්තන් ද (මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) “හඳගල වලගම්බා පුරාණ ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාව” යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරිය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) හඳගල වලගම්බා පුරාණ ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාවට සුගත තරුණ බෞද්ධ සංගමය, සුගත කුළඟන සමිතිය, මෛත්‍රිපාල සේනානායක අනුස්මරණ පළතුරු උද්‍යානය, රජමහා විහාරස්ථ කාර්යසාධක සමිතිය, දීපංකර දහම් පාසල, හඳගල කන්ද රජමහා විහාර පෙරහැර සංවිධානය, ඤාණවිමල ග්‍රාමීය සමාජ සංවර්ධන පදනම සහ හඳගල සතර පේරුවේ අවමංගල්‍යාධාර සමිතිය යනාදී සමිති සඳහා අවශ්‍ය දෑ සැපයීම නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම, බෞද්ධ ජනතාව තුළ ශාසනික ප්‍රබෝධය ඇති වන සේ කටයුතු සංවිධානය කිරීම සහ ප්‍රදේශවාසීන්ගේ සමාජ ආර්ථික කටයුතු වැඩිදියුණු කිරීම ;

(ආ) ඉහත සඳහන් හඳගල වලගම්බා පුරාණ ගල්ලෙන් විහාරස්ථ නව චෛත්‍යය, සමාධි ප්‍රතිමාව, සීමාමාලකය, හිටි පිළිමය, සංඝාවාසය හා වාහල්කඩ ඉදිකිරීම, මෙම ආයතනය පිහිටි ආරාම භූමියේ පළතුරු උයනක් ආරම්භ කිරීම ඇතුළු ආගමික හා සංස්කෘතික වශයෙන් වැදගත්කමක් ඇති ස්ථානයක් බවට ආරක්ෂා කර සංවර්ධනය කිරීම ;

(ඇ) ප්‍රදේශයේ දිළිඳු හා අසරණ අය සඳහා නිවාස, සෞඛ්‍ය පහසුකම්, පිරිසිදු පානීය ජල අවශ්‍යතාවන් සපුරාලීම ;

(ඈ) අදාළ දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය ලබන දුප්පත් දරුවන්ගේ අධ්‍යාපනය නගාසිටුවීමට පහසුකම් සැපයීම ;

(ඉ) සාමාජිකයන්ගේ ආගමික, සංස්කෘතික, සාමාජික හා සෞඛ්‍යමය සුභසාධන සේවා පවත්වාගෙන යාම, ඒවාට ධෛර්යය දීම සහ ආධාර කිරීම ;

(ඊ) බුද්ධ ධර්මය ආරක්ෂා කිරීම හා ප්‍රචාරය කිරීම ;

(උ) භික්ෂූන්ට ධර්මය සහ විනය ඉගැන්වීම, පුහුණු කිරීම, පාලි, සිංහල සහ වෙනත් පෙරඅපර භාෂා පිළිබඳ ප්‍රවීණත්වය ලබා දීම ;

(ඌ) බාල පරපුරට ධර්මඥානය ලබා දීම සඳහා දහම් පාසල් පිහිටුවීම ;

(එ) බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වල අන්තර්ගත පණිවුඩය සහ බෞද්ධ සංස්කෘතිය ලෝක සාමය උදෙසා පතුරුවා හැරීම ; සහ

(ඒ) අධ්‍යාපනය, සංස්කෘතිය, සන්නිවේදනය, නිරුපද්‍රිත පැවැත්ම, සංවර්ධනය හා සාමය පිළිබඳ ලෝක ප්‍රශ්න සාකච්ඡා කිරීම සඳහා රාජ්‍ය සංවිධාන වන හෝ නොවන ආගමික හෝ ගිහි ජාත්‍යන්තර සංවිධාන මගින් කැඳවනු ලබන සම්මන්ත්‍රණවල දී හා සම්මේලනවල දී බෞද්ධ ප්‍රජාව වෙනුවෙන් බෞද්ධ මතය ඉදිරිපත් කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු සභාපති, ගරු ලේකම්, ගරු භාණ්ඩාගාරික සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි සහ රීතිවලට අනුකූලව තෝරාපත් කර ගනු ලබන හය දෙනකුට නොඅඩු වෙනත් සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ කළමනාකාර කමිටුවක් විසින් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව කළමනාකරණය කරනු ලැබිය යුතු ය. සභාපති විහාරස්ථ භික්ෂූන් වහන්සේ නමක් විය යුතු ය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) සභාවේ ආරම්භක සාමාජිකයා වන ගරු හඳගල කන්ද පුරාණ ගල්ලෙන් රජමහා විහාරයේ පදවිය සුදර්ශනාරාමාධිපති කිරිමැටියාවේ ඤාණවිමල ස්වාමින් වහන්සේ සභාවේ උත්තරීතර සභාපති විය යුතු ය. සභාපතිවරයා කැඳෑවේ සමිත ස්වාමින් වහන්සේ විය යුතු අතර, ප්‍රධාන විධායක නිලධාරියා ද වෙයි.

(3) සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කමිටුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සභාවේ කළමනාකාර කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාගයන් භාර ගැනීමේ හා එකතු කිරීමේ ද, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කරගැනීමේ, සේවයේ යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද, බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ල ම හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියාවන් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ නෙරපීම ;

(ආ) නිලතල දරන්නන් තෝරා පත් කිරීම, ඔවුන් ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුර අත්හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, පැවැත්ම සහ කාර්ය ;

(ඇ) කළමනාකාර කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කිරීම ඔවුන්ගේ බලතල, පැවැත්ම සහ කාර්ය ;

(ඈ) සංස්ථාවේ කළමනාකාර කමිටුවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම් සහ පැවැත්වීම, එම් රැස්වීම් පැවැත්විය යුතු වේලාව, ස්ථානය, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය, පත්‍ර, එහි ගණපූරණය සහ එහි දී කටයුතු කර ගෙන යාම ;

(ඉ) සංස්ථවේ විවිධ නිලධරයන්ගේ අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, පැවැත්ම, කාර්ය සහ කර්තව්‍ය ;

(ඊ) සංස්ථවේ දේපල පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් තැබීම විගණනය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් කිසි රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන පරිද්දෙන් එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සභාවේ බලපැවැත්වූ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූලව නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදනු ලද රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් සහ සංස්ථාවට ගෙවිය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි සභාවේ පවත්නා සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සභාවට ගෙවිය යුතු සියලු ණය, ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

විගණනය සහ ගිණුම්.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ “සුදුසුකම් ලත් විගණකවරයා” යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, බද්දක් හෝ තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය සහ ශක්නුතාව ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**10.** කළමනාකාර කමිටුවේ සාමාජිකයකු සහ ගරු ලේකම්වරයා හෝ කළමනාකාර කමිටුව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු හෝ ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වූ යම් සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම, යම් තැනැත්තකු විසින් සාක්ෂිකරුවකු වශයෙන් කරනු ලබන අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් ඇති නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.